www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ අගනුවරට එල්ටීටීඊ ගුවන් ප්‍රහාරයක්

**LTTE air raid on Sri Lankan capital**

**සරත් කුමාර විසිනි**
**2007 මැයි 4**

ඉරිදා ශ්‍රී ලංකාවේ කොලඹ අගනගරයේ ඉන්ධන ගබඩා දෙකකට දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය එල්ල කල ගුවන් ප්‍රහාරයක් ආන්ඩුව හා මිලිටරිය වෙතින් අතිශයින් ම සන්ත්‍රාසජනක ප්‍රතිචාරයක් අවුලුවාලී ය. අඳුරට මුවා වී ගමන් කල සැහැල්ලු ගුවන් යානා දෙක කොලොන්නාවේ පිහිටි ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තෙල් පිරිපහඳු මධ්‍යස්ථානයට කුඩා බෝම්බ දෙකක් ද මුතුරාජවෙල පිහිටි ෂෙල් සමාගමට අයත් එල්පීජී ගෑස් ගබඩාවට තවත් එවන් බෝම්බ දෙකක් ද දැමී ය.

එම මධ්‍යස්ථානවලට සිදු වූ හානිය සුලු වුවත් මිලිටරිය ප්‍රතිචාර දැක්වූයේ නගරයේ විදුලි බල සැපයුම හා ජාත්‍යන්තර ගුවන් තොටුපල වසා දැමීමෙනි. ක්‍රිකට් ලෝලීන් බොහොමයක් ලෝක කුසලානයේ අවසාන තරඟයේ දී ශ්‍රී ලංකා කන්ඩායම ක්‍රීඩා කරනු නරඹනු පිනිස ඉරිදා අලුයම තෙක් අවදිව සිටියහ. නගරය අන්ධකාරයේ ගිලී ගොස් මිලිටරිය ගුවන් යානා නාශක තුවක්කු හා සැහැල්ලු ගිනි අවි ප්‍රහාර අතොරක් නැතිව එල්ල කරන්ට ගත් කල කොලඹ උපනගර ප්‍රදේශයක පිහිටි පිට්ටනියක රැස්ව සිටි 5000ක පමන පිරිසක් පලා ගියහ.

කුඩා ගුවන් යානා සොයා ගත නොහැකිව සිදු කෙරුනු වෙඩි ප්‍රහාර බොහොමයක් ඉලක්කයකින් තොරව අහඹු ලෙස එල්ල කල ඒවා විය. බිමට වැටුනු මූනිස්සම්වලින් කලුබෝවිල නිවාස තුනකට ද කොලොන්නාවේ නිවාස පහකට ද හානි සිදු විය. තෙල් මධ්‍යස්ථානයෙන් කිලෝ මීටර් 10කට වඩා දුරින් පිහිටි වැල්ලවත්තේ සිවිල් වැසියන් අට දෙනෙක් රෝහල් ගත කෙරුනි. කොලොන්නාවේ හා මිරිහානේ තවත් ගනනාවකට තුවාල සිදු විය. මේ කලබලය මධ්‍යයේ කොලඹ කැලිනිතිස්ස විදුලි බලාගාරයේ වෙඩි හුවමාරුවකට මැදිව සොල්දාදුවන් තිදෙනෙක් හා ආරක්ෂක භටයන් දෙදෙනෙක් තුවාල ලැබූහ.

ගුවන් හමුදා ප්‍රකාශක ගෲප් කපිතාන් අජන්ත සිල්වා සිදු වූ කිසිවක් ගැන කනගාටුව ප්‍රකාශ කිරීමකින් තොරව මාධ්‍යවලට කියා සිටියේ එම ව්‍යාකූල සහගත "ගුවන් ආරක්ෂක පද්ධතිය" අනාගතයේ දී ද භාවිත කෙරෙන බව යි. එල්ටීටීඊය දැන් ගුවන් ප්‍රහාර තුනක් එල්ල කර තිබේ. මාර්තු 26 දා එල්ල වූ ප්‍රථම ප්‍රහාරයෙන් කොලඹට උතුරෙන් පිහිටි කටුනායක මිලිටරි ගුවන් කඳවුරේ ගුවන් හමුදා භටයන් තිදෙනක් මරා දැමුනි. අප්‍රේල් 26 දා සිදු වූ දෙවන ප්‍රහාරය උතුරේ පලාලි මිලිටරි කඳවුර අසල යොදවා තිබූ හමුදා කන්ඩායමකට වැදී සොල්දාදුවන් හය දෙනෙක් මිය ගියේ ය.

මෑතම ප්‍රහාරය සිදු කෙරුනේ උතුරේ එල්ටීටීඊ බල මධ්‍යස්ථානය වන කිලිනොච්චිය අසල විස්වමඩු ප්‍රදේශයට ඊට යන්තම් පැයකට පෙර එල්ල වූ ගුවන් හමුදා ප්‍රහාරයකට පලිගැනීමක් ලෙස යැයි එල්ටීටීඊ මිලිටරි ප්‍රකාශක රාසයියා ඉලන්තිරයන් පැවසී ය. ක්‍රිකට් ලෝක කුසලාන අවසන් තරඟය පැවැත්වෙන කාලය තුල තමන් සටන් විරාමයක් පවත්වනු ඇතැයි එල්ටීටීඊය කලින් ඇඟවුම් කර තිබුනි.

2002 සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින්, පසුගිය ජූලි මාසයේ දී ජනාධිපති මහින්ද රාජපක්ෂ ආක්‍රමනික මෙහෙයුම් සඳහා අනුමැතිය ප්‍රකාශ කල අවස්ථාවේ පටන් මේ දක්වා එල්ටීටීඊයට දිවයිනේ නැගෙනහිර පිහිටි සිය පාලන ප්‍රදේශ බොහොමයක් අහිමි වී තිබේ. උතුරේ පිහිටි එල්ටීටීඊ ප්‍රදේශ ද තමන් අල්ලා ගන්නා බව ප්‍රකාශ කර ඇති මිලිටරිය ඒ සම්බන්ධයෙන් තත්වය මැන බැලීමේ ප්‍රහාර එල්ල කිරීම අරඹා ඇත.

එල්ටීටීඊයේ මෑත ම ගුවන් ප්‍රහාරයට ප්‍රතිචාර වසයෙන් ආරක්ෂක හමුදාවෝ කොලඹ හා ඒ අවට දැවැන්ත සෝදිසි මෙහෙයුමක් දියත් කලහ. ගුවන් ප්‍රහාරයට පෙරාතුව පවා. සෙනසුරාදා මිලිටරි භටයෝ වාහන 5000ක් හා සිවිල් වැසියන් 15,000ක් සෝදිසි කොට 16ක් අත් අඩංගුවට ගත්හ. කොලඹ නගරයට ඇතුලුවන සෑම වාහනයක් ම පාහේ දැන් සෝදිසියට ලක් කෙරේ.

එල්ටීටීඊ ගුවන් ප්‍රහාරයේ බලපෑම, විශේෂයෙන් ම පසු ගිය වසරේ එක්සත් ජනපද ඩොලර් මිලියන 410ක් ඉපැයූ සංචාරක කර්මාන්තය මත එය ඇති කල හැකි බලපෑම, පිලිබඳව ව්‍යාපාරික කොටස් උත්සුකතා ප්‍රකාශ කර තිබේ. සංචාරකයන් පැමිනීම පසු ගිය වසරේ සියයට 36කින් පහත වැටුනු අතර එය තව දුරටත් පහල වැටෙතැයි බලාපොරොත්තු වේ. ඕස්ට්‍රේලියාව හා සමහර යුරෝපීය රටවල් ශ්‍රී ලංකාවේ සංචාරය

කිරීම සම්බන්ධයෙන් සිතා බලන්නැයි නිවේදන නිකුත් කර තිබේ. ශ්‍රී ලංකාවට පැමිනෙන ප්‍රධාන ගුවන් සේවා දෙකක් වන කැතේ පැසිෆික් හා එමිරේට්ස් සිය ගුවන් ගමන් තාවකාලිකව අත්හිටුවා ඇත.

එල්ටීටීඊයේ ගුවන් ප්‍රහාරවලට මුහුන දෙනු පිනිස නව මිලිටරි උපකරන මිලට ගැනීමේ පීඩනයට ආන්ඩුව මුහුන දී සිටී. *සන්ඩේ ටයිම්ස්* ආරක්ෂක ලියුම්කරු ඉක්බාල් අතාස් පසු ගිය සති අන්තයේ මෙසේ අදහස් දැක්වී යඃ "එල්ටීටීඊය අත්පත් කර දෙන ඇති දේ (ගුවන් යානා) ප්‍රාථමික ලෙස පෙනී ගියත්, තමන්ගේ ම ගුවන් සීමාව ආරක්ෂා කර ගැනීමෙහි ලා ආන්ඩුව දක්වා ඇති අසරන භාවය, ඔවුන්ගේ පසු ගිය ගුවන් ප්‍රහාරක ගමන් හතර හරහා ඔවුන් පැහැදිලිව ම පෙන්නුම් කර ඇත."

ආරක්ෂක හමුදාවන් වඩා දියුනු පද්ධති මිල දී ගැනීමට උත්සාහ දරන බව මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ මාධ්‍යවලට පැවසී ය." ජාතික ගුවන් ආරක්ෂක පද්ධතියේ අඩුපාඩු" ජය ගැනීමටත් "සාර්ථක ලෙස නව තර්ජනයට මුහුන දීමටත් මිලිටරිය වෙතින් වඩා ප්‍රායෝගික පියවර අවශ්‍යවී" ඇතැයි සිය විශ්ලේෂකයන් පැවසුවේ යැයි ආරක්ෂක අමාත්‍යංශයේ වෙබ් අඩවිය සඳහන් කලේ ය.

රාජපක්ෂ ආන්ඩුව උත්සන්න කෙරෙන සිය යුද්ධය සඳහා ආරක්ෂක වියදම් දැනටමත් දැවැන්ත ලෙස ඉහල දමා ඇත. මේ වසර සඳහා අයවැයෙන් රුපියල් බිලියන 139ක් නැතහොත් එක්සත් ජනපද ඩොලර් බිලියන 1.25ක් වෙන්කර ඇති අතර එය පසු ගිය වසරට වඩා සියයට 28ක වැඩි වීමකි. මේ වසරේ යුද වියදම් ඉක්මනින් ම ඩොලර් බිලියන 1.8 කරා ලඟා වනු ඇතැයි හිටපු ගුවන් හමුදාපති හැරී ගුනතිලක *හින්දුස්ථාන් ටයිම්ස්* පත්‍රයට පැවසී ය.

බඩු මිල විශාල ලෙස ඉහල යමින් යුද වියදමේ බර බොහෝ සෙයින් වැටී ඇත්තේ වැඩ කරන ජනතාව මත ය. පසු ගිය වසරේ උද්ධමන අනුපාතිකය සියයට 17ක් දක්වා නැංගේ කෘෂිකාර්මික කම්කරුවන්ගේ මූර්ත වැටුප් සියයට 10කින් ද සේවා අංශයේ මූර්ත වැටුප් සියයට 12කින් ද පහත දමමිනි.

මිලිටරිය හා එල්ටීටීඊය අතර ගැටුම් අඛන්ඩව සිදු වේ. ඉරිදා ආරක්ෂක හමුදාවෝ කයිට්ස් දිවයිනේ වේලනෙයි ප්‍රදේශයේ දී එල්ටීටීඊ සටන්කරුවන් පස් දෙනෙකු හා හින්දු පූජකයකු ඝාතනය කලහ. බදාදා මිලිටරිය නිවේදනය කලේ තමන් උතුරේ වන්නි ප්‍රදේශයේ එල්ටීටීඊ යුද පෙරමුන අසල දී එල්ටීටීඊ සටන්කරුවන් 13ක් මරා දමා ඇති බව යි.

එල්ටීටීඊ-හිතැති *ටැමිල්නෙට්* වෙබ් අඩවියට අනුව, බ්‍රහස්පතින්දා 300ක පමන සොල්දාදුවන් පිරිසක් උතුරේ මන්නාරම-වවුනියා ප්‍රදේශයේ එල්ටීටීඊ මධ්‍යස්ථාන වෙත ප්‍රහාරයක් දියත් කොට ඉන් අනතුරුව ඉවත්ව ගියේ ය. ගැටුමේ දී එල්ටීටීඊ භටයෙක් හා සොල්දාදුවන් දෙදෙනෙක් ඝාතනයට ලක් වුනු බව එම ලිපිය කියාපෑවේ ය. පසු ගිය සති ගනනාව තිස්සේ මිලිටරිය එම ප්‍රදේශයේ "මුදා ගැනීමේ මෙහෙයුම්වල" යෙදී ඇතැයි යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා *දි අයිලන්ඩ්* පත්‍රය කල සාකච්ඡාවක දී පිලිගත්තේ ය.

නැගෙනහිර පලාතේ එල්ටීටීඊයේ අවසන් බල මධ්‍යස්ථානය වන තොප්පිගල වෙත ප්‍රහාරයක් එල්ල කිරීමට ද මිලිටරිය සූදානම් වේ. විවිධ එල්ටීටීඊ-විරෝධී පැරා-මිලිටරි කන්ඩායම් සමග තමන් කිසිදු සහයෝගීතාවක් පවත්වන්නේ නැතැයි ආන්ඩුව දිගින් දිගටම කියා සිටින නමුදු පසුගිය ඉරිදා *ලක්බිම* පත්‍රය වාර්තා කල පරිදි, කරුනා කන්ඩායමේ 500ක පමන සටන්කරුවන් පිරිසක් ප්‍රහාරයේ දී හමුදාවට සහාය දීම පිනිස පුහුනුවීම්වල යෙදී සිටී.

මිලිටරිය හා ඒ සමග සහයෝගීව ක්‍රියා කරන පැරා-මිලිටරි කන්ඩායම් ප්‍රදේශයේ ජනතාව ත්‍රස්ත කිරීමෙහි ද යෙදී සිටිති. පසු ගිය වසර තුල දී සිවිල් වැසියන් සිය ගනනක් පැහැර ගැනීමට හෝ ඝාතනයට ලක්ව තිබේ. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් දෙමල ජාතිකයන් ය. පසු ගිය සෙනසුරාදා යාපනයේ පල කෙරෙන *උදයන්* පත්‍රයේ තරුන වාර්තාකරුවකු වන සෙල්වරාජා රජිවර්මන්, යතුරු පැදියකින් පැමිනි "නාඳුනන තුවක්කුකරුවන්" විසින් ඝාතනය කරන ලදි. ඊලම් මහජන ප්‍රජාතන්ත්‍ර පක්ෂය (ඊපීඩීපී) ඒ සම්බන්ධයෙන් වගකිව යුතු යැයි යාපනයේ මාධ්‍යවේදීන් චෝදනා කර තිබේ.

2005 නොවැම්බරයේ දී රාජපක්ෂ බලයට පැමිනි දා පටන් මේ දක්වා යලි අවුලුවන ලද යුද්ධය නිසා 4000කට පමන ජීවිත අහිමි වී 300,000ක් පමන අවතැන්ගතව තිබේ. ඔවුන්ගෙන් වැඩි දෙනා දෙමල ජාතිකයන් ය. ආන්ඩුව, සිය මිලිටරි මෙහෙයුම් උත්සන්න කිරීමත් සිය වර්ගවාදී යුද්ධයට එරෙහි ඕනෑම විරුද්ධත්වයක් තව දුරටත් තලා දැමීමත් පිනිස කොලඹට එල්ල වූ එල්ටීටීඊයේ මෑතම ගුවන් ප්‍රහාරය මගින් නිර්මානය කෙරුනු සන්ත්‍රාසය නිසැකව ම ඩැහැ ගනු ඇත.

© www.wsws.org